# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 61 දරන කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 26 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2009 අංක 61 දරන කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 26 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී) — 5/2007.

**කරුණා සමාධි සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"කරුණා සමාධි සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ සහ ඒ පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා මෙතෙක් කල් පවත්වාගෙන ගොස් ඇති හෙයින් ද: පූර්විකාව.

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී සංවිධානය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 61 දරන කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) "කරුණා සමාධි සංවිධානයේ" දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කරුණා සමාධි සංවිධානය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කරුණා සමාධි සංවිධානය සංස්ථාගත කිරීම.

2-PL 004201 -2,650 (2008/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ආර්ථික අපහසුතාවලට මුහුණ දෙන්නා වූ ශ්‍රී ලාංකික පුරවැසි පවුල්වල අධ්‍යාත්මික සහ ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම;

(ආ) ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙන්නා වූ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය සඳහා මාසික මූල්‍යමය ආධාර ඇතුළත් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් උපකාර කිරීම;

(ඇ) ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙන්නා වූ රෝහල්ගත කරන ලද රෝගීන්ට ඖෂධ, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් අවශ්‍යතා සැපයීම, ගර්භනී මවුවරුන්ට සහ දරුවන්ට පෝෂ්‍යදායී ආහාර සහ රෙදිපිළි සැපයීම සහ වෛද්‍ය උපකරණ සහ වෙනත් උපකරණ රෝහල්වලට සැපයීම ;

(ඈ) ආබාධිත තැනැත්තන්ට සහ ඔවුන්ගේ පවුල්වලට උපකාර කිරීම;

(ඉ) තරුණයන් සඳහා අධ්‍යාපන පාඨමාලා, වෘත්තීය පුහුණු සහ වැඩමුළු පැවැත්වීම සහ උපදේශක සේවා මගින් පෞද්ගලික සහ මූල්‍යමය සුරක්ෂිතභාවය ලබා ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම;

(ඊ) එක්ව වැඩ කිරීමට උද්‍යෝග කිරීම සඳහා ශ්‍රමදාන කටයුතු සංවිධානය කිරීම ;

(උ) සංවිධානයේ ජාත්‍යන්තර ශාඛා පිහිටුවීම සහ පවත්වාගෙන යෑම ; සහ

(ඌ) පොදු රුචිකත්වයක් ඇති පොත්, ජර්නල්, මාසික වාර්තා, සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශනය කිරීම සහ බෙදා හැරීම සහ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.

(2) සංස්ථාව, එහි අරමුණු ක්‍රියාත්මක කිරීම, හැකි උපරිම ප්‍රමාණයට ජාතික, ආගමික, භාෂාමය, කුලය, ලිංගිකත්වය හෝ දේශපාලන මත පදනම් කර ගැනීමකින් තොරව කරගෙන යනු ලබන බවට වගබලා ගත යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා, සභාපතිවරයා සහ මූල්‍ය පරිපාලක, ලේකම්, නියෝජ්‍ය ලේකම්, භාණ්ඩාගාරික සහ නියෝජ්‍ය භාණ්ඩාගාරික සහ වසර පහක කාලයක් සඳහා සංස්ථාවේ රීතිවලට අනුකූලව පත් කරනු ලැබිය හැකි ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සහ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනතේ රීති යටතේ අළුත් කළමනාකරණ මණ්ඩලයක් පත් කරන තෙක්, මෙම පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ සංවිධානයේ ධුර දරන කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

දේපළ අත්කර ගැනීම. අරමුදල් ආයෝජනය සහ ණය මුදල් රැස් කිරීම ආදිය සඳහා සංස්ථාවට ඇති බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, කුලියට දීම, ඉදි කිරීම සහ අන්‍යාකාරයකින් අත්කර ගැනීම;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් හුවමාරු කළ හැකි සාදන පත්‍ර සකස් කිරීම, නිකුත් කිරීම, පිළිගැනීම සහ විකිණීම සහ බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ වසා දැමීම ;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා ඉක්මනින් අවශ්‍ය නොවන අරමුදල් කිසිවක් කළමනාකරණ මණ්ඩලය විසින් සුදුසු යයි සිතන යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඉ) දායක මුදල්, ප්‍රදාන, පරිත්‍යාග සහ සියලු ආකාරයේ ත්‍යාග අයැද සිටීම සහ ලබා ගැනීම;

(ඊ) යම් තැනැත්තකු; සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ යෙදවීම, සේවයෙන් ඉවත් කිරීම හෝ සේවය අත්හිටුවීම සහ ඔවුන්ට සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම ;

(ඌ) සංස්ථාවේ කාර්යය සඳහා සේවක මණ්ඩල ශ්‍රී ලංකාව තුල හෝ පිටරටවල දී පුහුණු කිරීම ; සහ

(එ) සංස්ථාවේ, සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් කාර්යක්ෂම සහ නිසි ආකාරයෙන් කර ගැනීමට අවශ්‍ය වන ආනුෂංගික හෝ හිතකර වන යම් ක්‍රියාවන්, කර්තව්‍ය සහ දේ ඉටු කිරීම.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමකට පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් සාමාජික පන්ති විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, නිලධරයන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ඔවුන්ගේ ධුරය හිස් කිරීම සහ කළමනාකරණ මණ්ඩලයේ බලතල, කාර්යය සහ චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්යය සහ කර්තව්‍යය;

(ඇ) සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම් කැඳවීම, රැස්වීම් පැවැත්වීම, එම රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වලදී සාකච්ඡා කළ යුතු කරුණු;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සහ එහි අරමුණු මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් එහි රීතිවලට යටත් විය යුතු ය.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ අරමුදල:—

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුවම දිනයේ සංවිධානයේ බැරට තිබූ මුදල් වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනට පසුව සංස්ථාවට සහ සංස්ථාව වෙනුවෙන් ලැබුණු ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම්, දායක මුදල් හෝ දීමනාවලින්

සමන්විත විය යුතු ය.

(3) මෙම පනත යටතේ ස්වකීය කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

**8.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) යටත් පිරිසෙයින් සෑම වර්ෂයකදීම එක් වරක් සංස්ථාවේ ගිණුම්, සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු අතර, එම වාර්තාව මහා සභා රැස්වීමක දී ඉදිරිපත් කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද එම සංස්ථාව විසින් නිකුත් කරන ලද ගණකාධිකාරීවරකු ලෙස සේවයේ යෙදීමේ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු ; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීම සඳහා එම සංස්ථාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද ගණකාධිකාරී ආයතනයක්, අදහස් වේ.

රැස්වීම් සහ ගණපූරණය.

**9.** යම් මුදල් වර්ෂයක් සඳහා, සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීම ඊළඟ වර්ෂයේ ජුනි මාසයේ දී පවත්වනු ලැබිය යුතු ය. සාමාජිකයන් හතරෙන් එකකට වැඩි සංඛ්‍යාවක් විසින් ලිඛිතව විශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය. එවැනි විශේෂ රැස්වීමක් පිළිබඳ දැන්වීම ඒ රැස්වීමට දින දහහතරකට පෙරාතුව සාමාජිකයන් වෙත ලබා දිය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය බැරකම් ගෙවා අවසන් කිරීමෙන් පසු යම් දේපළක් ඉතිරි වේ නම් එබඳු දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු ය. එහෙත් සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ ද, එහි හෝ

ඒවායේ හෝ රීති ප්‍රකාරව සිය සාමාජිකයන් අතර යම් ආදායමක් හෝ දේපළක් හෝ බෙදා හැරීම තහනම් වන්නා වූ ද යම් ආයතනයකට හෝ ආයතනවලට එකී දේපළ දෙනු ලැබිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන එම විසුරුවා හරින කාලය තුළ හෝ ඊට පෙරාතුව සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

11. සංස්ථාවේ සභාපති සහ ලේකම්වරයා ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

12. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.